කල්මුණේ මහ නගර සභාව
අම්පාර දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 22 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 දෙසැම්බර් 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කල්මුණේ මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර නොතිබුණි.

1.3.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත්කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු රු. 18,500 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ලෙජරය අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ආපසු ගෙවියයුතු තැන්පතු ශේෂය රු. 32,344,040 ක් වූවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු. 31,221,629 ක් ලෙස පෙන්වා තිබිමෙන් තැන්පතු ශේෂය රු. 1.122,411 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සභාව විසින් ස්ථාවර තැන්පත්වල තැන්පත් කරන ලද රු. 24,379,424 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබියයුතු රු. 3,090,687 ක පොලී ආදායම් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

(ඈ) ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ශේෂය රු. 8,007,878 ක් ලෙස පෙන්වා තිබුණද, මූල්‍ය ප්‍රකාශණවල රු. 8,089,127 ක් ලෙස පෙන්වා තිබීමෙන් සේවක ණය ශේෂය රු. 81,249 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2013 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රකාශනවල රු. 203,471,540 ක් ලෙස පෙන්වා තිබූ ස්ථාවර වත්කම්වල ශුදධ අගයේ එකතුව 2014 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ඒමේදී රු. 153,492,042 ක් ලෙස දක්වා තිබිමේන් සමාලෝචිත වර්ෂය අවසානයේ ස්ථාවර වත්කම්වල ශුදධ අගයේ එකතුව රු. 50,145,498 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ශබ්ද විකාශන යන්ත්‍ර මිලදි ගැනීම් සඳහා මිලගණන් කැදවා මිලදී ගෙන තිබුණද, එම ශබ්ද විකාශන යන්ත්‍ර රු. 49,950 ක් වැඩියෙන් මිලදී ගෙන ඇති බවට ගිණුම් ගත කර තිබිමෙන් වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ශයේදී සභාව විසින් රු. 695,000 ක මුදලකට "TATA ACE Zip" වර්ගයේ වාහනයක් මිලදීගෙන තිබූනද, එහි වටිනාකම් ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඌ) මස් කඩ බදූකරුවන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ මුදල වන රු. 2,972,603 කින් ගවයන් ලෙඩ වීම නිසා බදූකරුවන් වෙත රු. 247,717 ක ලබා දුන් සහන මුදල ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

(එ) විගණනයට ලැබුණු තොරතුරු අනුව, වාහන අළුත්වැඩියාවක් සඳහා පුද්ගලික ආයතනයකට 2014 නොවැම්බර් 11 වන දින ගෙවන ලද රු. 417,875 ක මුදල වියදමක් වශයෙන් ගිණුම්ගත නොකර වත්කමක් වශයෙන් ගිණුම්ගතකර තිබුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 සිට 2012 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අදාල අද දක්වා අයනොවී තිබෙන පොදු වෙළද පොල හිඟ බදු කුලි රු. 13,768,753 ක මුදල අයකර ගැනිමට හෝ බදූකරුවන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට විගණන දිනය වන 2015 ඔක්තොබර් 05 දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 සිට 2012 වර්ෂ දක්වාවූ කාල පරිච්ඡේදයට අදාල අද දක්වා අයනොවී තිබෙන හිඟ බදු මුදල රු. 6,436,834 අයකර ගැනීමට හෝ නීත්‍යානුකූලව කටයුතු කිරීමට විගණන දිනය වන 2015 ඔක්තෝබර් 05 දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) පොදු වෙළද පොළහි කඩ කාමර 475 ක් 1987 වර්ෂයේදී බදු දී තිබුණද 1996 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා කඩ කාමර බදු ගත් බදූකරුවන්ගෙන් අයවියයුතු රු. 13,497,553 ක මුදල අයකර ගැනීමට හෝ බදු කරුවන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට විගණන දිනය වන 2015 ඔක්තෝබර් 05 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) 1996 සිට 2013 වර්ෂය අවසානය දක්වාවූ කාල පරිච්ඡේදයට අදාල අද දක්වා අයනොවී තිබෙන බයිසිකල් සහ වාහන ගාල් කිරීම් ගාස්තු හිඟ මුදල රු. 3,325,163 ක මුදල අයකර ගැනීමට හෝ අදාල අයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට විගණන දිනය වන 2015 ඔක්තෝබර් 05 දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත දක්වන එක්එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයන් | වටිනාකම් | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 119,239,060 | ඉඩම් ඔප්පු |
| ලිබඩු සහ සවි කිරීම් | 4,751,565 | ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,086,250 | |
| මෝටර් වාහන සහ කරත්ත | 11,130,013 | |

| | | |
|---|---|---|
| ණය හිමි | 9,945,808 | ශේෂ සනාථ කිරීම් සහ ණයහිමි ලේඛන |
| පොදු වෙළඳ පොල හිඟ කඩකාමර කුලි | 13,497,553 | බදු ලේඛන |
| හිඟ අත්තිකාරම් | 34,981,246 | අත්තිකාරම් ලේඛනය |

1.3.6 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදි නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මහ නගර සභා ආඥා පනත | |
| 252 වන පරිච්ඡේදයේ 218 වන වගන්තිය | කොමසාරිස් විසින් ඔහුගෙ පරිපාලනය සම්බන්ධයෙන් එක්එක් ගිණුම් වර්ෂය වෙනුවෙන් පිළියෙල කලයුතු වාර්ෂික පරිපාලන වාර්තාව 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර ඉදිරපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (I) මු.රෙ. 396 (ඩී) | නිකුත්කර මාස හයක් ඉකුත්වී බැංකුවට ඉදිරිපත් නොකළ එකකුව රු. 69,462 ක චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් අදාල විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (II) මු.රෙ. 571 | රු. 989,162 ක් වටිනා කල් ඉකුත්වූ නැන්පත් 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 4,559,836 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 2,190,353 ක් විය. මෙය මූල්‍ය ප්‍රතිඵලයේ රු. 6,750,189 ක පිරිහිමක් පෙන්නුම් කෙරිණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 වරිපනම් බදු

මහ නගර සභා ආඥා පනතේ 251(1)(ආ) වගන්තිය ප්‍රකාරව සභාව බල ප්‍රදේශයේ වාසය දේපල හිමියන් 45,545 දෙනෙකුගෙන් 1988 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවියයුතු රු. 83,475,778 ක වරිපනම් බදු අයකර ගැනීම සඳහා 2012 වර්ෂයේ පත්කරන ලද බදු අයකිරීමේ නිලධාරින් 05 දෙනෙකුට දේපල තහනම් කිරීම් නිලධාරින් 03 දෙනෙකුට භාරදී තිබුණද ඉකුත් වර්ෂ විලට අදාල මුදල් සමාලෝචිත වර්ෂයේ රු. 5,285,342 ක් පමණක් අයකර ගෙන තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දුර්වලතා

(අ) ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදයේ 1.3 වගන්තිය අනුව එක් එක් නිලධාරින්ගේ පැමිණීම සහ පිටත්වීම පැමිණීමේ ලේඛනයේ සටහන් කර අත්සන් කළයුතු වුවද මහ නගර සභාවේ පශු වෛද්‍ය නිලධාරි සහ ඉංජිනේරු යන අය තමාගේ පැමිණීම පැමිණීමේ ලේඛනයේ අත්සන් තබා නොතිබුණද 2014 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වැටුප් හා දීමනා වශයෙන් පිළිවෙලින් රු. 538,440 ක් සහ රු. 311,220 ක් ලබා දී තිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දින හා 09/2009 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සියළුම ආයතනවල නිලධාරින් පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කළයුතු බව සඳහන් කර තිබුණද නිලධාරින් 177 දෙනෙකු සේවය කරන මහ නගර සභාවේ ඇඟිලි සලකුණු යෙදීමේ යන්ත්‍රය විගණන දිනය වන 2015 ඔක්තෝබර් 05 දිනය දක්වා සවිකර නොතිබුණි.

(ඇ) වර්ෂ දෙකකට පෙර ස්ථාන මාරුවී ගිය නිලධාරින් 08 දෙනෙකුගෙන් අයවියයුතු රු. 339,973 ක ණය ශේෂය අයකර ගැනීම සඳහා 2015 ඔක්තෝබර් 05 දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී වීදි පහන් නඩත්තු කිරීම සඳහා රු. 1,194,675 ක මුදලට වීදි පහන් සහ සවිකිරීම් මිලදී ගෙන තිබුණද එම භාණ්ඩ සභාවේ ගබඩාවට භාරනොදී සභාපතිගේ ලේකම් විසින් ඍජුව භාරයට ගෙන බෙදාහැර ඇති බැවින් එම භාණ්ඩ අදාල අවශ්‍යතාවයන් සඳහා යොදවා තිබේදැයි විගණනයේ දී තහවුරු නොවුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මහ නගර සභා අරමුදලින් ආගමික ස්ථානයක ගොඩනැගිල්ලක් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා රු. 222,300 ක ගෙවීමක් කර තිබුණද 2015 ඔක්තෝබර් 05 වන දින පවත්වන ලද විගණන පරික්ෂණ දක්වා මහ නගර සභා විසින් එම කර්මාන්තය නිම කිරීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදීගෙන නොතිබුණි. උක්ත මෙම කර්මාන්තය සඳහා 2013 වර්ෂයේදී "දැයට කිරුළ" වැඩ සටහන යටතේ අම්පාර දිසත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු. 391,020 ක් වැයකර තිබුණි.

(ඊ) මස් කඩ බදු ගත් බදුකරුවන් තිදෙනෙකුගෙන් ඇප මුදල් වශයෙන් රු. 544,154 ක් වටිනා චෙක්පත් 06 ක් 2013 සහ සමාලෝචිත කාල පරිච්ඡෙදයේදී ලැබී අදාල කාල පරිච්ඡේදයදීම බැංකු ගත කිරීමෙන් පසු බැංකුව ගෙවීම් ප්‍රතික්ෂේපකර තිබුණි. මෙසේ ප්‍රතික්ෂේපවූ චෙක්පත් වෙනුවෙන් බදුකරුවන්ගෙන් මුදල් අයකර ගැනීමට හෝ බදු කරුවන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට විගණන දිනය වන 2015 ඔක්තෝබර් 05 දින දක්වා ක්‍රියාකර නොතිබුණි.

(උ) මහ නගර සභා විසින් 2013 වර්ෂයේ ලැප්ටොප් පරිඝණකයක් රු. 85,000 ක මුදලකට මිලදී ගෙන කාර්යාල අවශ්‍යතාවයන් සඳහා විධායක නිලධාරියෙකුට භාරදී තිබුණි. එම නිලධාරියා 2014 අප්‍රේල් 30 වන දින ස්ථාන මාරුවීගොස් තිබුණද එම ලැප්ටොප් පරිඝණකය ආපසු ලබාගැනීම සඳහා විගණන දිනය වන 2015 ඔක්තෝබර් 05 දිනය දක්වා මහ නගර සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඌ) කාර්යාලයන් පිහිටා තිබෙන ස්ථානයන් විදහා දක්වන පුවරුවක් පිළියෙල කර සවි කිරීම සඳහා 2013 වර්ෂයේදී රු. 123,000 ක මුදලක් ගෙවීම් කර තිබුණද, 2015 ඔක්තෝබර් 05 වන දින විගණන පරීක්ෂණය දක්වා අදාල පුවරුව මහ නගර සභාවේ සවිකර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රිය වත්කම්
------------------

සභාව සතු අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි තත්වයේ ට්‍රැක්ටර් රථ 07 ක්, ට්‍රේලර් 04 ක්, වතුර බවුසර් 01 ක්, පික්කබ් රථ 01 ක්, එක්සවේටර් යන්ත්‍රයන් යනාදිය අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් නිෂ්ක්‍රියව තිබුණි.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයන් පිහිටුවා ගත යුතු බව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 වන දින හා අංක 03 දරණ පළාත් පාලන ප්‍රතිසංස්කරනය පිළිබඳ චක්‍රලේඛයේ 08 වන ඡේදයෙන් පෙන්වා දී තිබු පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයන් පිහිටුවා නොතිබුණි.

4.2 පිළිතුරු නොලත් විගණන විමසුම්
-------------------------------------

2011 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා නිකුත්කළ විගණන විමසුම් 25 කින් 24 කට මෙතෙක් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

5 පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් රැස්කිරීම්

(ඇ) ස්ථාවර වත්කම් පාලනය